**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - 2023**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා වසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2019 ජූලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය | අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2023 දෙසැම්බර් 31 දින වනවිට රු. 1,459,690 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාල පනතේ 8(1) (d) වගන්තිය යටතේ ස්ථාපිත කරන ලද සේවක සංවර්ධන අරමුදලට අදාළ මුදල් ස්ථාවර තැන්පතු ලෙස පවත්වා ගෙන යනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ | උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයෙහි 07 වන වගන්තිය හා 2018 දෙසැම්බර් 17 දිනැති අංක 2/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | උසස් අධ්‍යාපන ආයතන 22 ක අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ 551 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම මත 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2,262ක් අයකර යුතුව තිබුණි. | බැඳුම්කර කඩකර ඇති බවට හඳුනාගත් 347 දෙනෙකුගේ මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති අතර එයින් 139 දෙනෙකු මේ වන විට ගෙවීම් කටයුතු ආරම්භ කර ඇත. ඉතිරි 204 දෙනාගේ මුදල් අයකර ගැනීම පවතින නීති රීති යටතේ සිදු කල නොහැකි බැවින් ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි බැඳුම්කර කඩකළ නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 49.88 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.මිලියන 282.6 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 232.72 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු.2,647,969ක් වූ විවිධ තොග වසර 2 සිට වසර 5 ක කාලයක සිට ගබඩාව තුල නිෂ්කාර්යව පැවතුණි | COVID ව්‍යාප්තිය නිසා වැඩි කාලයක් ආයතනය වසා තැබීම හා විද්‍යුත් මාධ්‍යයන් මඟින් වැඩ කටයුතු සිදු කිරීමට වැඩි වශයෙන් යොමු වීම නිසා ඉතිරි වී ඇති මෙම තොග අයිතමයන් හැකි පමණ විශ්වවිද්‍යාල වෙත බෙදාහැරීම මඟින් භාවිතා කිරීමට කටයුතු යොදා ඇති බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකල යුතුය. |
| (ආ) | ස්ත්‍රී පුරුෂ සමානාත්මකතාව / සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රයට 2020 සිට 2022 වර්ෂවල ලැබුණු පැමිණිලි අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 23.5 සිට සියයට 36.6 ක් වැනි අඩු පරාසයක පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේ ඔක්තොම්බර් 31 දක්වා ලැබී තිබුණු පැමිණිලි 68 න් පැමිණිලි විසඳීමේ ප්‍රගතිය සියයට 14.7 ක් වැනි අඩු මට්ටමක පැවතුණි. | ලැබෙන පැමිණිලි සම්බන්ධව දින 14 ක් ඇතුළත විමර්ශනය කර වාර්තා කරන මෙන් ආදාල විශ්වවිද්‍යාලවල උපකුලපතිවරු වෙත දැනුම් දෙනු ලැබේ. එසේ වුවද, අවසාන වශයෙන් සිසුන් හා කාර්ය මණ්ඩලය පිළිබඳ පැමිණිලි සම්බන්ධව විමර්ශනය කර විනය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව අවසාන බලධාරියා අදාළ විශ්වවිද්‍යාල වල පාලක මණ්ඩලය බැවින් ඒ සම්බන්ධව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය සීමා වී ඇති බව. | ලැබෙන පැමිණිලි පරික්ෂාකර අවසන් ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේ දී මාසික කුලිය රු.350,000 කට ලබා ගෙන තිබුණු වර්ග අඩි 3,337කින් යුත් ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නොවීම සහ ප්‍රවාහන අපහසුතා පැවතීම මත එම කල්බදු ගිවිසුම අවලංගු කර වර්ග අඩි 7,000 කින් සමන්විත වූ ගොඩනැගිල්ලක් රු.950,000ක මාසික කුලියට ලබා ගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය 2020 නොවැම්බර් 09 දින ලැබී තිබුණි. නමුත් එම අනුමැතියට පටහැනිව මාසික කුලිය රු.350,000ක් වූ කුලී ගිවිසුම අවලංගු නොකර නව ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබීම | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපේක්ෂා කල 2017 වසරේදී කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන අංශය, තත්ත්ව ප්‍රතීතන කවුන්සිලය සහ විශ්වවිද්‍යාල අභියාචනා සේවා මණ්ඩලය යන අංශ නව ගොඩනැගිල්ලට ගෙන ඒමට නව ගොඩනැගිල්ලේ ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවුණි මේ පිළිබඳව දීර්ඝ ලෙස අධ්‍යයනය කර 2017 වසරේදී කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලද තවදුරටත් කුලී පදනම මත පවත්වා ගෙන යාම | රජයට වඩාත් වාසිදායක වන ආර්ථිකමය තීරණ ගත යුතුය. |

| | | |
|---|---|---|
| හේතුවෙන් 2021 වර්ෂයේ සිට තවදුරටත් එම ගොඩනැගිල්ල වෙනුවෙන් 2024 මාර්තු දක්වා එකතුව රු.12,600,000ක් ගොඩනැගිලි කුලී වශයෙන් ගෙවා තිබුණි. | සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ඇති බව. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020/2021 හා 2021/2022 අධ්‍යයන වර්ෂ දෙක සඳහා විශ්වවිද්‍යාල වලට සිසුන් ඇතුළත් කිරීමෙන් පසු තවදුරටත් පිළිවෙලින් පුරප්පාඩු 1857ක් හා 1084ක් පැවති අතර එම පුරප්පාඩු වෙනුවෙන් නැවත සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම අධ්‍යයන වර්ෂ දෙකේදී පමණක් සිසුන් 2941කට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පුරප්පාඩු සඳහා සිසුන් අනුයුක්ත කලද එම සිසුන් ප්‍රවේශය භාර නොගැනීම මත පුරප්පාඩු ඇති වේ. | පුරප්පාඩු ප්‍රමාණය අවම කර උපරිම වශයෙන් ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2009 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පශ්චාත් උපාධි ප්‍රදාන ලබාගත් ප්‍රදානලාභීන් 22 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දින දක්වා පාඨමාලාව සම්පූර්ණ කර නොතිබුණු අතර ඔවුන්ගෙන් 11 දෙනෙකු වෙත ලබා දී තිබූ ප්‍රදානයන්ගෙන් රු.17,498,461ක් 2023 දෙසැම්බර් 31 දක්වා අයකර ගත යුතුව පැවතුණි. 2022 සහ 2023 වර්ෂවලදී කිසිදු අයදුම්කරුවෙකු වෙත පශ්චාත් උපාධි ප්‍රදාන ලබාදී නොතිබුණි. | පශ්චාත් උපාධි ප්‍රදාන ලබා ගත් ප්‍රදානලාභීන් 22 ගෙන් 11 දෙනෙකුගේ මුදල් අයකරගෙන ඇති අතර 03 දෙනෙකුගේ මුදල් අර්ධ වශයෙන් අය කරගෙන තිබේ. අනෙකුත් අය සම්බන්ධයෙන් අදාළ විශ්වවිද්‍යාල වෙත සිහිකැඳවීමේ ලිපි යවා ඇති බව.<br><br>පවතින රාජ්‍ය මුදල් නීති රෙගුලාසි වලට අනුව 2022 සහ 2023 යන වර්ෂ වලදී පශ්චාත් උපාධි ප්‍රදාන ලබා දීම සිදුනොවූ බව. | පාඨමාලාව සම්පූර්ණ නොකළ ප්‍රදානලාභීන්ගේ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂයේදී මෘදුකාංග සංවර්ධනය සඳහා රු.1,148,000 ක් වැයකර තිබුණ ද, අදාළ කාර්යය නිමකර නොතිබුණි. | 2020 හා 2021 වසර වලදී ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය හේතුවෙන් මූලික කළමණාකරණ තොරතුරු රැස් කිරීම සඳහා වන මෘදුකාංග පද්ධතිය සංවර්ධන කිරීමේ කටයුතු ප්‍රමාද විය. මේ වන විට එම මෘදුකාංගයේ සංවර්ධන කටයුතු අවසන් අදියරේ පවතින බව. | අදාළ කාර්යය කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |